# තනතුරු පුරප්පාඩු

## මුස්ලිම් ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව

## ශ්‍රී ලංකා වකූෆ් සභාව

## නීති නිලධාරී තනතුර (තාවකාලික)

සුදුසුකම්ලත් අයදුම්කරුවන්ගෙන් ඉහත තනතුර සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ.

- **(අ) අධ්‍යාපන සුදුසුකම්** : ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් නීතිය පිළිබඳව උපාධියක් ලබා තිබීම හා ශ්‍රී ලංකා ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතිඥයකු වශයෙන් දිවුරුම් දී තිබීම.
- **(ආ) වෙනත් සුදුසුකම්** : දෙමළ, සිංහල හා ඉංග්‍රීසි යන භාෂා ත්‍රිත්වයෙන් වැඩ කිරීමේ හැකියාව හා මනා පරිගණක හැකියාවක් තිබීම. වකූෆ් පනත පිළිබඳ දැනුම හා අවබෝධය ලබා තිබීම අමතර සුදුසුකමක් වශයෙන් සලකනු ලැබේ.
- **(ඇ) වයස** : අවුරුදු 24ට නොඅඩු හා අවුරුදු 45ට නොවැඩි විය යුතුය.
- **(ඈ) වැටුප** : රු. 47,615.00ක වැටුපට අමතරව වකූෆ් සභාව විසින් අනුමත අනෙකුත් දීමනාද මාසික වැටුපට ඇතුළත්කර ගෙවීම් සිදු කරනු ඇත.
- **(ඉ) පත්වීමේ ස්වභාවය** : තාවකාලික පදනම මත එක් වසරක් සඳහා බඳවා ගනු ලැබේ. අවශ්‍යතාවය මත සේවා කාලය දීර්ඝ කිරීමට කටයුතු කරනු ලැබේ.
- **(ඊ) සෑම ඉල්ලුම් කරුවෙකුම**

  i. ශ්‍රී ලංකා පුරවැසියෙකු විය යුතුය.

  ii. තනතුරට පැවරෙන කාර්යයන් මැනවින් ඉටු කිරීම සඳහා අවශ්‍ය වන කායික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.

  iii. විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතුය.

**අයදුම්පත් එවිය යුතු ආකාරය :**

www.muslimaffairs.gov.lk වෙබ් අඩවියේ ඇති අයදුම් පත්‍රය නිසිලෙස සම්පූර්ණ කර 2020.09.07 දින හෝ ඊට පෙර අධ්‍යක්ෂ, මුස්ලිම් ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව, අංක 180,ටී.බී.ජයා මාවත, කොළඹ 10 යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුවේ.

**අධ්‍යක්ෂ,**

**මුස්ලිම් ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව,**

**අංක 180, ටී.බී. ජයා මාවත, කොළඹ 10.**